මෝටර් රථ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව

2025 ජුනි 26

මෝටර් රථ රක්ෂණය

පූර්ණ මෝටර් රථ රක්ෂණයක් මඟින් ඔබගේ වටිනා වාහනයට හදිසි අනතුරු, ගිනි, ගංවතුර හා ස්වාභාවික විපත් සහ සොරකම් ආදිය මඟින් සිදුවන හානි සඳහා මූල්‍යමය රැකවරණය සලසයි.

මෝටර් රථ රක්ෂණය

අමතර ආවරණ

- මෝටර් රථ අනතුරු හේතුවෙන් රෝහල්ගත වීම සහ ගිලන් රථ සඳහා ආවරණය (hospitalisation and ambulance cover)
- මගීන් සඳහා පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ ආවරණය (personal accident benefit for passengers)
- රියදුරු සඳහා කම්කරු වන්දි ආවරණය (workmen’s compensation insurance (WCI) cover for driver)
- 100% වායු බෑග් ආවරණය (100% airbag cover)
- වාහනය ඇදගෙන යාමේ වියදම් සඳහා ආවරණය (towing cover)
- වාහනයේ කොටස් සොරකම් කිරීම සඳහා ආවරණය (theft of parts cover)

මෝටර් රථ රක්ෂණය

01 වාහන හිමිකරුවෙකු සහ රක්ෂණ සමාගමක් අතර ගිවිසුමකි.

02 අනතුරු හා සොරකම් ආදියෙන් රක්ෂණය කර ඇති වාහනයට හෝ එම රක්ෂිත වාහනය මගින් තෙවන පාර්ශවීය පුද්ගලයින්ට/දේපළවලට සිදුවන අලාභ හානි සඳහා මූල්‍යමය රැකවරණය සලසයි.

03 මාර්ගයේ ගමන් කරන සෑම වාහනයකටම, තෙවන පාර්ශ්වයන්ට සිදුවන මරණ සහ ශාරීරික තුවාල සඳහා වන ආවරණයක් අනිවාර්යයෙන්ම තිබිය යුතුය.

04 මෝටර් රථ රක්ෂණයක් මගින් වැඩ වර්ජන, කැරලි කෝලහල, සිවිල් කැලඹීම් සහ ස්වාභාවික විපත් ආදිය සඳහාද ආවරණ ලබා ගත හැකිය.



මෝටර් රථ අනතුරක් සිදු වූ විට, ඔබ කළ යුත්තේ කුමක්ද?

01 පළමුව, අනතුර පිළිබඳව පොලීසිය දැනුවත් කළ යුතුය.

02 දෙවනුව, අනතුර පිළිබඳව රක්ෂණ සමාගම දැනුවත් කළ යුතුය. අනතුර දැනුම් දීම සඳහා ඔබට රක්ෂණ සමාගමේ පැය 24 පුරාම ක්‍රියාත්මක ක්ෂණික ඇමතුම් අංකය ඇමතිය හැකිය.

03 රක්ෂණ සමාගමේ නියෝජිතයෙකු අනතුර සිදු වූ ස්ථානයට පැමිණෙන තෙක් රැඳී සිටිය යුතුය. තෙවන පාර්ශවයක් සිටී නම්, ඔවුන්ටත් රැඳී සිටින ලෙස ඉල්ලා සිටින්න. අනතුරෙන් මාර්ගය අවහිර වී ඇත්නම්, පොලිස් නිලධාරියාගෙන් අවසරය ලබාගෙන වාහනය මාර්ගයෙන් ඉවතට ගන්න. කිසි විටෙකත් මාර්ගය අවහිර නොකරන්න.



මෝටර් රථ අනතුරක් සිදු වූ විට,

ඔබ කළ යුත්තේ කුමක්ද?

04 රක්ෂණ සමාගමේ නියෝජිතයාට අනතුර පිළිබඳව නිවැරදි තොරතුරු ලබා දෙන්න. මෝටර් රථ හිමිකම් මුදල් ගෙවීමේදී ඔබ සපයන තොරතුරු වැදගත් වනු ඇත.

හිමිකම් මුදල් ඉල්ලීමේ ක්‍රියාවලිය (Claims Process) කුමක්ද?

01 හිමිකම් මුදල් ඉල්ලීමේ පෝරමය (claim form) සම්පූර්ණ කර ඔබ විසින් රක්ෂණ සමාගමට ඉදිරිපත් කළ යුතුය.

02 වාහනය සඳහා අලුත්වැඩියා ඇස්තමේන්තුවක් (estimate) සහ අමතර කොටස් මිල ගණන් (spare part quotation) ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය.

03 ඉදිරිපත් කරන ලියකියවිලි මත පදනම්ව රක්ෂණ සමාගම හිමිකම් මුදල් ඉල්ලීම (claim) අනුමත කරනු ඇත. තක්සේරුකරු (assessor) ගරාජයේදී වාහනය සම්බන්ධ අතිරේක පරීක්ෂාවන් සිදු කරනු ඇත. තක්සේරුකරු ගරාජ ඇස්තමේන්තුව අනුමත කර පසු වාහන අලුත්වැඩියාව ආරම්භ කළ හැකිය.

හිමිකම් මුදල් ඉල්ලීමේ ක්‍රියාවලිය (Claims Process) කුමක්ද?

04 අලුත්වැඩියාව අවසන් වූ පසු, අවසාන බිල්පත් රක්ෂණ සමාගමට ඉදිරිපත් කළ යුතුය. අලුත්වැඩියාවෙන් පසු පරීක්ෂාව සඳහා වාහනය ඉදිරිපත් කර සුන්බුන් භාර දෙන්න. සියලු අවශ්‍යතා සම්පූර්ණ වූ පසු අනුමත වූ හිමිකම් මුදල් ගෙවනු ලැබේ.

05 හිමිකම් මුදල් පියවීම චෙක්පතක් හෝ බැංකු ගිණුමකට බැර කිරීමක් වශයෙන් ඔබට ලබා දෙනු ඇත. රක්ෂණ නියෝජිතයා හෝ රක්ෂණ සමාගම ඇමතීම මගින් ඔබට හිමිකම් මුදල් ලබාගැනීම සඳහා කැමති ක්‍රමයක් තෝරාගත හැක.

මෝටර් රථ රක්ෂණය ගැන ඔබ දැනගත යුතු වැදගත් කරුණු

වාහන භාවිතය (Vehicle Usage)

- පුද්ගලික භාවිතය සහ වාණිජ භාවිතය සඳහා එකිනෙකට වෙනස් රක්ෂණ ආවරණ තිබේ. ඔබ වාහනයෙන් ආදායමක් උපයන්නේ නම් වාණිජ මෝටර් රථ රක්ෂණයක් තෝරා ගත යුතුය.
- රක්ෂණය තෝරාගැනීමෙන් අනතුරුව ඔබ වාහනය භාවිතා කළ යුත්තේ එම රක්ෂණයට අදාළ කාණ්ඩයේ අරමුණු සඳහා පමණි.
- ඔබ රක්ෂණය කළ කාණ්ඩය හැර වෙනත් අරමුණක් සඳහා භාවිතා කරන්නේ නම්, එවැනි අවස්ථාවකදී ඔබේ හිමිකම් මුදල් ඉල්ලීම ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

වෙළඳපළ වටිනාකම (Market Value)

- ඔබ සැමවිටම ඔබේ වාහනය වෙළඳපළ වටිනාකමට රක්ෂණය කළ යුතුය. ඔබ වාහනය අඩු මුදලකට රක්ෂණය කර ඇත්නම් (under insurance), හිමිකම් මුදල් ඉල්ලීමකදී ඔබට නිසි මුදල හිමි නොවීමට ඉඩ ඇත.
- රක්ෂණය කිරීමේදී නිවැරදි වෙළඳපළ වටිනාකම දැනගැනීම සඳහා ඔබට පිළිගත් වාහන තක්සේරුකරුවෙකුගෙන් විමසිය හැකිය.
- තවද, වාහනයේ වෙළඳපළ වටිනාකම කොපමණ දැයි ඔබේ රක්ෂණ නියෝජිතයාගෙන් හෝ රක්ෂණ සමාගමෙන්ද විමසිය හැකිය.

ඔබේ වාහනය විකුණන විට කුමක් සිදුවේද?

- වාහනය අලෙවි කරන අවස්ථාවකදී ඔබේ මෝටර් රථ රක්ෂණය නව හිමිකරු වෙත පැවරිය නොහැක. වාහනය විකිණීමෙන් පසු ඔබේ මෝටර් රථ රක්ෂණය අවලංගු වේ.

- නව හිමිකරු (new owner) වාහනය සඳහා නව මෝටර් රථ රක්ෂණයක් මිලදී ගත යුතුය. ඔබටත් වෙනත් රක්ෂිතයෙකුගේ මෝටර් රථ රක්ෂණයක් භාවිතා කළ නොහැක.

ඔබට කළ හැක්කේ කුමක්ද?

- ඔබට ඔබේ මෝටර් රථ රක්ෂණය අවලංගු කර භාවිතයට නොගත් කාලය සඳහා වාරිකය ආපසු ඉල්ලා සිටිය හැක.

- නැතහොත්, ඔබට අදාළ වාරිකය වෙනත් රක්ෂණයකට බැර කළ හැක.